# (උ) රජයේ මුදල් පරිහරණය

**1961-62 මුදල් වර්ෂය**

1961 ඔක්තෝබර් සිට 1962 සැප්තැම්බර් මාසය තෙක් වූ මුදල් වර්ෂය සඳහා ලංකාණ්ඩුවේ ගිණුම් සාරාංශය, පසුගිය වර්ෂවල අනුරූප සංඛ්‍යා තොරතුරු ද සමග II උ–1 සංඛ්‍යා සටහනෙහි දක්වේ. මේ සටහනෙහි දක්වා ඇති පරිදි අය–වැය ලේඛන ගනුදෙනුවල ප්‍රධාන ලක්ෂණ මෙසේ ය :—

(අ) 1961/62 මුළු ආදායම රුපියල් කෝටි 162·53 ක් විය.[1] 1960/61 මුළු ආදායම රුපියල් කෝටි 151·39 ක් වූ අතර 1959/60 දී රුපියල් කෝටි 140·38 ක් විය.

(ආ) 1961/62 සම්මත මුළු වියදම, රුපියල් කෝටි 206·76 ක් විය[2]. 1960/61 සම්මත මුළු වියදම රුපියල් කෝටි 196·22 ක් වූ අතර, 1959/60 දී රුපියල් කෝටි 182·0 ක් විය. මේ සංඛ්‍යාවලට නිදන් අරමුදල් දීමනා, ආදායමෙන් කෙළින් ම ගෙවන ලද රාජ්‍ය ණය සහ පොත් ගැලපිළි ඇතුළත් නොවේ.[3] 1959/60 සංඛ්‍යාවලට විශේෂ ණයක් වශයෙන් මහ බැංකුවෙන් ලබා ගෙන, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගෙවන ලද රුපියල් කෝටි 3·7 ක දායක දීමනාව ද ඇතුළත් නොවේ.

(ඇ) අත්තිකාරම් ගනුදෙනු ගිණුම්වල, රුපියල් කෝටි 1·46 ක (ශුද්ධ) ගෙවීමක් ඇති විය. 1960/61 ගෙවූ ප්‍රමාණය (ශුද්ධ) රුපියල් කෝටි 1·42 ක් වූ අතර, 1959/60 එය රුපියල් කෝටි 0·13 ක් විය.

(ඈ) මේ ආදායම් සහ වියදම් අනුව රජයට රුපියල් කෝටි 45·69 ක (ශුද්ධ) අයවැය හිඟයක් ඇති විය. 1960/61 ඇති වූ හිඟය රුපියල් කෝටි 46·25 ක් වූ අතර 1959/60 දී හිඟය රුපියල් කෝටි 41·75 ක් විය.

මුලින් ඇස්තමේන්තු කළ අය–වැය හිඟය රුපියල් කෝටි 28·05 ක් වුවද,[4] නියම (ශුද්ධ) අය–වැය හිඟය, රුපියල් කෝටි 45·69 ක් වීමෙන් මුල් ඇස්තමේන්තුව රුපියල් කෝටි 17·64 කින් ඉක්මවා ගියේ ය. 1960/61 නියම වශයෙන් ඇති වූ අය–වැය හිඟය මුල් ඇස්තමේන්තුවට වඩා රුපියල් කෝටි 13·64 කින් වැඩි විය.

1960/61 දී මෙන් ම නියම වශයෙන් ඇති වූ හිඟය සහ ඇස්තමේන්තු කළ හිඟය අතර වෙනසට ප්‍රධාන වශයෙන් ම හේතු වුයේ, බලාපොරොත්තු වූ ආදායම අඩුවී යාමය. මේ වසරේ බලාපොරොත්තු වූ ආදායම රුපියල් කෝටි 15·14 කින් අඩු වූ අතර, 1960/61 දී මෙය රුපියල් කෝටි 12 කින් අඩු විය. ආදායමෙහි මෙසේ ඇති වූ අඩුව, ප්‍රාග්ධන වියදම් රුපියල් කෝටි 3·75 කින් අඩු වී යාමෙන් තරමක් මැකී ගියේ ය.

**ආදායම**

1961/62 මුල් ඇස්තමේන්තු සහ නියම වශයෙන් ලැබුන ආදායම ප්‍රධාන ආදායම් ශීර්ෂ යටතේ වර්ග කොට පරිශිෂ්ටයේ 18 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. 1961/62 රජයේ මුළු ආදායම, රුපියල් කෝටි 162·53 ක් විය. මෙය 1960/61 නියම වශයෙන් ලැබුන ආදායමට වඩා

---

1 මේ සංඛ්‍යා රජයේ ගිණුම්වල පළ කර ඇති සංඛ්‍යාවලට වෙනස් වෙයි. එහි ජාතික ගංවතුර අරමුදලෙන් ආදායමට එකතු කළ මුදල වන රුපියල් කෝටි 2·06 ක් අතහැර ඇති අතර, රජයේ ගිණුම්වල විශේෂ අරමුදලට බැර වශයෙන් සටහන් කොට ඇති ජාතික සංවර්ධන බද්දෙන් ලැබුන රුපියල් කෝටි 1·86 ඇතුළත්කොට ඇත.

2 සම්මත වැයවලට, විදේශීය ණය සහ දීමනා වලින් වැය වන සියලුම වියදම් ඇතුළත් වෙයි. මෙයට පෙර ප්‍රධාන වශයෙන් කොළඹ ක්‍රමය යටතේ සහ ඇමරිකා ආධාරවලින් කැරුන වියදම් ''අය–වැය ලේඛනයෙන් බාහිර'' වියදම් ලෙස සලකන ලදි.

3 II උ–1 සංඛ්‍යා සටහනේ අධෝලිපිය බලන්න.

4 1961/62 අය-වැය ලේඛනයෙන් ප්‍රකාශිත හිඟය රුපියල් කෝටි 34·0 ක් විය. කමිටු අවස්ථාවේ දී කැරුන සංශෝධන සමග පාර්ලිමේන්තුවෙන් සම්මත වූ මුල් අය-වැය ඇස්තමේන්තුවෙහි, දළ වශයෙන් රුපියල් කෝටි 32.94 ක හිඟයක් සලසා තිබිණි. ශුද්ධ අය-වැය හිඟය වන රුපියල් කෝටි 28·05 සෑද ගනු ලැබුයේ නිදන් අරමුදලට දුන් දායක දීමනා සහ විදේශ ණය බේරීම සඳහා යෙදූ රුපියල් කෝටි 4·89, ඉහත කී මුදලින් අඩු කර ගැනීමෙනි.

# රජයේ ශුද්ධ අයවැය

**සංඛ්‍යා සටහන II උ—1**

| | 1951-52 | 1952-53 | 1953-54 |
|---|---|---|---|
| **1. ශුද්ධ අයවැය අතිරික්තය/හිඟය (–)** | – 257·1 | – 231·9 | 33·7 |
| **(අ) ආදායම** | 954·0 | 952·5 | 1,026·2 |
| **(ආ) වියදම (එනම්, ණය ගැනීම් හෝ ණය දීම් ගනුදෙනුවල ශුද්ධ ලැබීම හෝ ගෙවීම අත්හැර මුළු ගෙවීම්)** | – 1,211·1 | – 1,184·4 | – 992·5 |
| (1) ආවර්තන වියදම (නිදන් අරමුදල් දයක දීමනා හා ආදායමෙන් ගෙවන අවක්‍ර රාජ්‍යණය බේරීම් හැර) (2 (ආ) (1) බලන්න*) .. .. .. .. | – 1,004·6 | – 893·5 | – 772·0 |
| (ආහාර ආධාර) .. .. .. .. | (247·8) | – (127·0) | (12·0) |
| (2) ප්‍රාග්ධන වියදම්* .. .. .. .. | – 203·0 | – 220·6 | – 162·3 |
| (3) ජාතික සංවර්ධන සංචිතයට අය වෙන වියදම .. | – 7·7 | – 6·4 | – 3·2 |
| (4) ගබඩා තොග හා උපකරණ ගිණුමට අත්තිකාරම් .. | – 16·8 | – 2·4 | 4·6 |
| (5) අනෙකුත් අත්තිකාරම්* .. .. .. | 19·0 | – 52·8 | – 61·1 |
| (6) විවිධ .. .. .. .. .. | 2·0 | – 8·7 | 1·5 |
| **හිඟය පියවීම** | | | |
| **2. රජයේ ණය ගනුදෙනුවලින් උද්ගත වන ලැබීම් හා ගෙවීම් (ශුද්ධ) සහ විදේශීය දීමනා ලැබීම්** .. | 184·1 | 216·5 | – 35·3 |
| **(අ) පාලන ණය ගැනීම් හා ණය ගෙවීම් (විවිධ කටයුතු සඳහා ගත් ණය ඇතුළුව)** | – 34·2 | 11·9 | – 4·6 |
| (1) තැන්පතු (නඩු කියන්නන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන් යනාදීන්ගෙන් හා 1959/60ට වියදම් නොකොට ඉතිරි වී ඇති විදේශාධාර) .. .. .. .. | – 16·2 | 21·4 | – 2·1 |
| (2) විවිධ අරමුදල් (වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල, රජයේසේවකයන්ගේ අර්ථසාධක අරමුදල ආදිය) | – 0·6 | – 0·2 | 0·3 |
| (3) විවිධ ණය (කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනය, ප්‍රාදේශීය ණය, සංවර්ධන අරමුදල හා පළාත් පාලන මණ්ඩල ආදියට) .. .. .. | 18·6 | – 9·3 | – 2·8 |
| **(ආ) දේශීය වෙළෙඳ ණය ගැනුම් හා ගත් ණය ආපසු ගෙවීම්** | 218·3 | 204·6 | – 94·0 |
| (1) රුපියල් ණය .. .. .. .. | 102·4 | 80·0 | 70·0 |
| නිදන් අරමුදල් දයක දීමනා හා ආදායමෙන් ගෙවන අවක්‍ර රාජ්‍ය ණය බේරීම් අත්හැර .. .. | 18·4 | 23·1 | 22·6 |
| | 84·0 | 56·9 | 47·4 |
| (2) භාණ්ඩාගාර බිල්පත් .. .. .. .. | 62·3 | 90·6 | – 78·1 |
| (3) මහ බැංකු අත්තිකාරම් .. .. .. | 72·0 | – 1·5 | – 4·7 |
| (4) බදු සංචිත සහතික .. .. .. .. | — | — | — |
| (5) අනෙකුත්† .. .. .. .. | — | 58·6 | 58·6 |
| **(ඇ) විදේශීය ආධාර** | — | — | 63·3 |
| (1) ණය .. .. .. .. | — | — | 63·3 |
| ආපසු ගෙවීම් අත්හැර .. .. .. .. | — | — | — |
| | — | — | 63·3 |
| (2) දීමනා .. .. .. .. .. | — | — | — |
| **3. මුදල් ශේෂයන්ගේ වෙනස්වීම් (පහසුවෙන් මුදල් කළ හැකි වත්කම් ඇතුළුව)** | – 73·0 | – 15·4 | – 1·6 |

* 1960–61 අය වැය ඇස්තමේන්තුවල ''ආදායමට අයවෙන වියදම්'' සහ ''ණය අරමුදල්වලට අය වෙන වියදම්'' යනුවෙන් වියදම් වර්ග කිරීමේ මෙතෙක් පැවති ක්‍රමය අත්හැර, ඒ වෙනුවට රජයේ මුළු වියදම්, පෞද්ගලික වැටුප්, පරිපාලන වියදම්, දෙපාර්තමේන්තු විසින් සැපයෙන සේවා, ආර්ථික සංවර්ධනය යන විසින් කොටස් හතරකට බෙදන ලදි. පසුව දක්වන ලද එක් එක් වර්ගය වර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් නැවත දෙවර්ගයකට බෙදන ලදි. මෙසේ රජයේ මුළු වියදම ශීර්ෂ හතකට බෙද දක්වා ඇත. මේ සටහනෙහි, වැය ශීර්ෂ 1, 2, 4 හා 6 යටතේ දක්වා ඇති පෞද්ගලික වැටුප් සහ වර්තන වියදම් ද, වැය ශීර්ෂ 3, 5, හා 7 යටතේ ප්‍රාග්ධන සඳහා වූ මුළු වියදම ද, වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් වෙන් කොට දක්වා ඇත. 1960–61 වර්ෂයට පෙර වර්ෂය සඳහා මෙවැනි වර්ග කිරීමෙක් නොමැති නිසා, ආදායමට අයවෙන වියදම් හා ණය අරමුදල් වලට අයවෙන වියදම් වෙන වෙනම ආවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වලට සමානවෙතැයි සලකනු ලැබේ.

ගතවූ මුදල් වර්ෂ වලදී වැය වූ ණය කාර්යයන් සඳහා අත්තිකාරම් ගිණුම්හි පාඩු 'වර්තන වියදමට' හා ප්‍රාග්ධන වියදමට මාරු කිරීමෙන් උද්ගතවන පොත් ගැලපිලි (හර සහ බැර) අත්හැර ඇත. එබැවින් ලංකාණ්ඩුවේ ගිණුම්වල සංඛ්‍යාවන් හා මෙහි සංඛ්‍යාවන් නොසැසඳේ.

## අතිරික්තය/හිඟය (—)

රුපියල් දශ ලක්ෂ

| 1954-55 | 1955-56 | 1956-57 | 1957-58 | 1958-59 | 1959-60 | 1960-61 (ඇ) | 1961-62(ඈ) |
|---|---|---|---|---|---|---|---|
| 127·6 | – 1·2 | – 196·4 | – 222·3 | – 413·4 | – 417·5 | – 462·5 | –456·9 |
| 1,158·6 | 1,257·2 | 1,260·5 | 1,280·0 | 1,330·4 | 1,403·8 | 1,513·9 | 1,625·3(ඉ) |
| –1,031·0 | –1,258·4 | –1,456·9 | –1,502·3 | –1,743·8 | –1,821·3 | –1,976·4 | –2,082·2 |
| – 864·9(අ) | – 1,014·4 | – 1,105·2 | – 1,280·1 | –1,432·2 | 1,511·9(ආ) | – 1,540·8 | – 1,581·0 |
| (36·0)(අ) | (79·5) | (105·5) | (112·0) | (146·5) | (193·0) | (248·0) | (235·4) |
| – 215·5(අ) | – 211·0 | – 213·3 | – 282·6 | – 303·4 | – 306·6 | – 419·9 | – 485·9 |
| – 2·1 | – 4·0 | – 5·1 | – 3·0 | – 2·4 | – 1·5 | – 1·5 | – 0·7 |
| 9·9 | 1·2 | – 14·5 | — | 10·5 | – 7·1 | 1·9 | 2·4 |
| 34·0 | – 30·3 | – 115·8 | 54·5 | – 17·1 | 5·8 | – 15·9 | – 15·8 |
| 7·6 | 0·1 | 3·0 | 8·9 | 0·8 | — | – 0·2 | – 1·2 |
| – 39·0 | 12·2 | 175·4 | 174·7 | 351·8 | 411·6 | 462·5 | 497·1 |
| 29·1 | – 36·5 | – 9·4 | 72·5 | 27·6 | 57·4 | 29·4 | 104·5 |
| 34·5 | – 10·8 | 9·0 | 73·9 | 27·3 | 62·3 | 36·5 | 98·4 |
| – 0·9 | – 4·8 | – 2·3 | 20·1 | 4·2 | 2·7 | – 1·0 | 4·8 |
| – 4·5 | – 20·9 | – 16·1 | – 21·5 | – 3·9 | – 7·6 | – 6·1 | 1·3 |
| – 80·2 | 43·5 | 166·2 | 78·5 | 291·2 | 327·6 | 406·5 | 334·4 |
| 75·0 | 74·5 | 94·9 | 45·0 | 95·0 | 134·8 | 214·9 | 145·0 |
| 44·5 | 39·0 | 31·1 | 26·5 | 29·7 | 30·6 | 32·1 | 39·5 |
| 30·5 | 35·5 | 63·8 | 18·5 | 65·3 | 104·2 | 182·8 | 105·5 |
| – 44·9 | 8·0 | – 3·0 | 74·6 | 179·0 | 228·2 | 198·4 | 248·0 |
| – 65·8 | — | 96·3 | – 13·8 | 41·1 | 3·1(ආ) | 20·6(ආ) | – 21·0 |
| — | — | 9·1 | – 0·8 | 5·8 | – 7·9 | 4·7 | 1·9 |
| 12·1 | 5·2 | 18·6 | 23·7 | 33·0 | 26·6 | 26·6 | 58·2 |
| 12·1 | 5·2 | 18·6 | 23·7 | 35·5 | 29·3 | 16·3 | 44·5 |
| — | — | — | — | 2·5 | 2·7 | 3·0 | 5·3 |
| 12·1 | 5·2 | 18·6 | 23·7 | 33·0 | 26·6 | 13·3 | 39·2 |
| — | — | — | — | — | — | 13·3 | 19·0 |
| 88·6 | 11·0 | – 21·0 | – 47·5 | – 61·7 | – 6·0 | ... | 40·2 |

සංඛ්‍යා— ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

†අර්ධ රාජ්‍ය නියෝජ්‍යත්වයන්ගෙන් ගත් ණය.

(අ) 1954–55 හේ ආහාර ආධාර සඳහා වූ රුපියල් කෝටි 3·6 ක මුදලක් අත්තිකාරම් ගිණුමේ සිට 1958–59 දී ආදායමට අය වෙන වියදමට මාරු කරන ලදී. මේ පොත් ගැලපිල්ල 1958–59 සංඛ්‍යාවන්ගෙන් ඉවත් කර තිබුන ද, (*සංලක්ෂ්‍යය බලන්න). 1954–55 සංඛ්‍යාවන් එය ඇතුළත් කිරීමෙන් සංශොධනය කර ඇත.

(ආ) බ්‍රෙටන්වුඩ් ගිවිසුම් පනත යටතේ මහ බැංකුවෙන් ලබා ගත් විශේෂ ණය මුදලකින් 1959–60 දී ගෙවන ලද රුපියල් කෝටි 3·7 ක ජාත්‍යන්තර මුදල් මණ්ඩලයට වැඩි කළ දායක දීමනාව හා 1960/61 දී ජා.ප්‍ර ස.බැ.ට සහ ජා.ස.ස.ට කළ රුපියල් කෝටි 0·22 ක ගෙවීම හා මහ බැංකුවෙන් ලත් රුපියල් කෝටි 0·02 විශේෂ ණයකින් ජා.ස.ස.ට කළ ගෙවීම අත්හැර ඇත.

(ඇ) 1960–61 සිට, විදේශාධාර වලින් කැරෙන ප්‍රාග්ධන වියදම්, අය–වැය ලේඛනයට ඇතුළත් කොට ඇත. 1960–61 සංඛ්‍යා විදේශාධාර වලින් වැය වන සංඛ්‍යා ඇතුළත් කිරීමට සංශෝධන කැරුන නිසා 1961 වාර්ෂික වාර්තාවේ පළවූ සංඛ්‍යා වලට වඩා වෙනස් වෙයි. 1960/61 ට පෙර විදේශීය දීමනා වලින් වියදම් නොකොට ඉතිරිව භාණ්ඩාගාරයේ මුදල් මාර්ගයක්ව පැවැති ශේෂ පමණක් පරිපාලන ණය ගැනීම් යටතේ ඇතුලත් කැරිණි.

(ඈ) තාවකාලිකයි.

(ඉ) මේ සංඛ්‍යාව, රජයේ ගිණුම්වල පළ කැරුන සංඛ්‍යාවලට වඩා වෙනස් වෙයි. රජයේ ගිණුම් සංඛ්‍යාවලට, ජාතික ගංවතුර සහනාධාර අරමුදලෙන් ආදායමට පැවැරූ රුපියල් කෝටි 2·06 ක් ඇතුළත් නොකැරුනු අතර, රජයේ ගිණුම්වල ජාතික සංවර්ධන අරමුදලට ආදායම වන රුපියල් කෝටි 1·86 ක් ඇතුළත් කොට තිබේ.

රුපියල් කෝටි 11·14 කින් වැඩි විය. 1960/61 දී ද ආදයමට ඊට පෙර වර්ෂයට වඩා රුපියල් කෝටි 11·01 කින් වැඩි වී තිබිණි. මේ වසරේ ආදයම 1960/61 ආදයමට වඩා වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ආනයන බදු (රුපියල් කෝටි 3) ප්‍රධාන වශයෙන් අරක්කු සහ දුම්කොළ ඇතුළු දේශීය භාණ්ඩ බද්ද (රුපියල් කෝටි 3·3) සහ ජාතික සංවර්ධන බද්ද යි (රුපියල් කෝටි 1·9) අපනයන බදු වලින් ලද ආදයම රුපියල් කෝටි 1·1 කින් අඩු විය.

එහෙත්, 1961/62 මුල් ඇස්තමේන්තු හා සසඳා බලන විට, නියම වශයෙන් ලැබුන ආදයම රුපියල් කෝටි 15·14 කින් අඩු වී ඇත. ආදයම මෙසේ අඩු වී යාමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ, අලෙවි බද්ද (රුපියල් කෝටි 4·5) වෘත්තීය හා ව්‍යාපාර ලියා පදිංචි කිරීමේ බද්ද (රුපියල් කෝටි 3·4) අධිභාරය ඇතුළු ආදයම් බද්ද (රුපියල් කෝටි 1·9) ආනයන බදු (රුපියල් කෝටි 2·1) විදුලි බලය දෙපාර්තමේන්තු ආදයම (රුපියල් කෝටි 1·3) සහ ජාතික සංවර්ධන බද්ද (රුපියල් කෝටි 0·6) අඩු වී යාමය.

1961/ 62 ආදයමෙහි ඇති වූ ප්‍රධාන වෙනස්කම් 1960/61 නියම වශයෙන් ලැබුන ආදයම සහ 1961/62 මුල් ඇස්තමේන්තු හා සසඳා පහත දක්වා ඇත :—

සංඛ්‍යා සටහන II උ—2

රුපියල් දශ ලක්ෂ

| | 1961/62 මුල් ඇස්ත මේන්තු | 1961/62 නියම | 1960/61 නියම | 1960/61න් 1961/62ට වෙනස | මුල් ඇස්ත මේන්තු අනුව 1961/62ට වූ වැඩිය හෝ අඩුව |
|---|---|---|---|---|---|
| 1. අපනයන බදු .. | 295 | 292 | 303 | —11 | — 3 |
| (අ) තේ (බද්ද ඇතුළුව) .. | 222 | 226 | 213 | +13 | + 4 |
| (ආ) රබර් (රබර් අපනයන බලපත්‍ර බද්ද ඇතුළුව) .. | 46 | 30 | 54 | —24 | —16 |
| (ඇ) පොල් .. | 22 | 31 | 30 | + 1 | + 9 |
| 2. ආනයන බදු .. | 486 | 465 | 435 | +30 | —21 |
| (අ) කපු පිළි .. | 18 | 25 | 21 | + 4 | + 7 |
| (ආ) මත් පැන් .. | 16 | 14 | 12 | + 2 | — 2 |
| (ඇ) දුම්කොළ සහ සිගරට් .. | 91 | 52 | 62 | —10 | —39 |
| (ඈ) අනෙකුත් භාණ්ඩ .. | 170 | 192 | 160 | +32 | +22 |
| 3. ආදයම් බද්ද .. (අධිභාරය හැර) | 242 | 232 | 230 | + 2 | —10 |
| අධිභාරය .. | 40 | 31 | 29 | + 2 | — 9 |
| 4. වියදම්, ධන හා ත්‍යාග බදු .. | 16 | 12 | 12 | 0 | — 4 |
| 5. අරක්කු විකිණීමෙන් ලාබ .. | 72 | 72 | 65 | + 7 | 0 |
| 6. දුම්කොළ බද්ද .. | 60 | 63 | 45 | +18 | + 3 |
| 7. කළු තෙල් රථ බද්ද .. | 12 | 9 | 2 | + 7 | — 3 |
| 8. විදුලිය දෙපාර්තමේන්තුවේ ආදයම .. | 45 | 32 | 27 | + 5 | —13 |
| 9. 1960/61 අය-වැය ලේඛනයෙන් පැනවූ අලුත් බදු | | | | | |
| (අ) ඉඩම් බද්ද .. | 12 | 12 | 8 | + 4 | 0 |
| (ආ) වෘත්තීය හා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ බද්ද | 37 | 3 | 3 | 0 | —34 |
| (ඇ) කොටස් ප්‍රාග්ධන බද්ද .. | 6 | 2 | 2 | 0 | — 4 |
| (ඈ) වීසා බද්ද .. | 6 | 6 | 3 | + 3 | 0 |
| 10. 1961/62 අයවැය ලේඛනයෙන් පැනවූ අලුත් බදු | | | | | |
| (අ) අලෙවි බද්ද (ක්‍රියාත්මක නොකැරිණි) .. | 45 | 0·1 | — | +0·1 | —45 |
| (ආ) ජාතික සංවර්ධන බද්ද .. | 25 | 19 | — | +19 | — 6 |
| (ඇ) සලාක සහල් පොත් බද්ද .. | 5 | 0·1 | — | 0 | — 5 |
| (ඈ) අධි බද්ද .. | 1 | 0 | — | 0 | — 1 |
| 11. වෙනත් ආදයම් .. | 372 | 375 | 350 | +25 | + 3 |
| එකතුව .. | 1777 | 1625 | 1514 | +111 | —152 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1960/61 වසර හා සසඳන විට අපනයන බදු වලින් ලැබුන මුළු ආදයම, රුපියල් කෝටි 1·1 කින් අඩු විය. මෙයට හේතු වූයේ තේ වලින් ලද ආදයම රුපියල් කෝටි 1·3 කින් සහ පොල්වලින් ලද ආදයම රුපියල් දශ ලක්ෂයකින් වැඩි වුවද, රබර් වලින් ලද ආදයම රුපියල් කෝටි 2·4 කින් අඩු වී යාමය.

රබර් සඳහා වූ නියමිත බද්ද වෙනුවට 1961–11–24 වැනි දින අනුප්‍රමාණ බද්දක් පනවන ලදී. රබර් වෙළෙඳ පොල අසතුටුදයක වෙත්ම, පැන වූ අනුප්‍රමාණ බද්දක් සමග බදු අඩු කිරීමක් ද ඇති විය. අනුප්‍රමාණ බද්ද අනුව රබර් රාත්තලක බද්ද සත 13 ක් විය. එහෙත් නියමිත බදු ප්‍රමාණය අනුව එය රාත්තලකට සත 20 ක් විය. තේ සහ පොල් වලින් ලද ආදයම වැඩි වීමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ පිටරට පැට වූ ප්‍රමාණය වැඩි වීමය.

ආනයන බදු ආදයම පසුගිය වසරට වඩා රුපියල් කෝටි 3·0 කින් වැඩි විය. වැඩි වූ ආදයම ප්‍රධාන වශයෙන් ලැබුනේ රේගුවෙන් ''අනෙකුත් භාණ්ඩ'' යටතේ වර්ග කොට ඇති භාණ්ඩ වලිනි. මේ මාර්ගයෙන් වැඩි ආදයමක් ලැබීමට හේතු වූයේ විටින් විට බදු වැඩි කිරීම නිසාය. 1961 ජනවාරි මාසයේ ආහාර වර්ගවලට හැර අනෙක් භාණ්ඩ වලට සියයට 5 ක පොදු ආනයන බද්දක් පනවන ලදී. ආදයම කෙරෙහි මේ බද්දේ සම්පූර්ණ බලපෑම ඇති වූයේ 1961/62 වසරේ දී ය. 1962 ජූලි මාසයේ දී 1962/63 අය–වැය ලේඛනයෙන්, තෝරා ගත් භාණ්ඩ සඳහා ආනයන බදු නැවත වැඩි කරන ලදී. ඉල්වා අස්කරගත් අලෙවි බද්ද වෙනුවට පවත්නා බදු ප්‍රමාණයන්, 1962 අගෝස්තු මාසයේ දී සියයට 20 කින් වැඩි කරන ලදි. 1961/62 අය–වැය ලේඛනයෙන් බදු වැඩි කිරීමත් සමග ආනයන අඩුවීයාම නිසා දුම්කොළ සහ සිගරට් ආනයන බද්දෙන් ලද ආදයම රුපියල් කෝටි 1·0 කින් අඩුවිය. දුම්කොළ සහ සිගරට් වලින් ලද ආදයම ඇස්තමේන්තු කළ ආදයමට වඩා රුපියල් කෝටි 3·9 කින් අඩුවීම මෙහි දී සැලකිය යුතු ය. මේ අනුව මුල් ඇස්ත මේන්තුව, අඩු වන අලෙවිය ගැන නොතකා, වැඩි වූ බදු අනුව පමණක් ඇස්තමේන්තු කළ බව පැහැදිළිය. මේ පාඩුව මකාලීමට මෙන් මෙරට දුම්කොළ බද්දෙන් ලද ආදයම රුපියල් කෝටි 1·8 කින් වැඩි විය. මේ බද්ද ද, 1961/62 අය-වැය ලේඛනයෙන් වැඩි කැරිණි.

1960–61 පනවන ලද බදු වලින් 1961/62 දී වැඩියෙන් ලැබුනේ රුපියල් කෝටි 0·7 ක් පමණකි. මෙයින් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ආදයම රුපියල් කෝටි 6·1 ක් වුව ද, ලැබුණු මුළු ආදයම රුපියල් කෝටි 2·3 ක් විය. මෙසේ ආදයම අඩුවීයාමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ වෘත්තීය සහ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ බද්දෙන් බලාපොරොත්තු වූ ආදයම නොලැබී යාමයි. මෙයින් රුපියල් කෝටි 3·7 ක් බලාපොරොත්තු වුවද, ලැබුනේ රුපියල් කෝටි 0·3 ක් පමණෙකි. වසරකට රුපියල් 3,600 ට අඩුවෙන් ආදයම් ලැබෙන වෘත්තීන් හා ව්‍යාපාර ද බදු යටතට ගෙන මුල් ඇස්තමේන්තුව සකසා තුබුන ද, නීති ගත කිරීමේ දී එකී ව්‍යාපාර සහ වෘත්තීන් බදු වලින් නිදහස් කරන ලදී. මේ මාර්ගයෙන් ලැබුන ආදයම අඩු වී යාමට මෙයත් පාලන පමාවත් හේතු වූවා විය හැකි ය.

1961/62 අය-වැය ලේඛනයෙන් පනවන ලද අලුත් බදු වලින්, ජාතික සංවර්ධන බද්දෙන් රුපියල් කෝටි 2·5 ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ද ලැබුන ප්‍රමාණය රුපියල් කෝටි 1·9 ක් විය. 1961/62 දී රුපියල් කෝටි 4·5 ක ආදයමක් ලැබෙනැයි ඇස්තමේන්තු කළ අලෙවි බද්ද 1962 ජූලි මාසයේ අග දී 1962/63 අය-වැය ලේඛනය ඉදිරිපත් කරන තෙක් පැන වූයේ නැත. එහෙත් එය පනවා දෙදිනකට පසු නැවත අස් කර ගත්තේ, භාණ්ඩ බොහෝ ගණනෙක පවත්නා බදු ප්‍රමාණයන් සියයට 20 කින් වැඩි කරන ලදි.

**වර්තන වියදම්**

1959–60 සිට 1962–63 තෙක්, වර්ෂවල වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම්, පිළිබඳ සංඛ්‍යා තොරතුරු පහත සංඛ්‍යා සටහනේ දක්වා ඇත:—

සංඛ්‍යා සටහන II උ—3

**රජයේ වියදම**

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | (1) වර්තන වියදම | ප්‍රාග්ධන වියදම් (2) | | |
|---|---|---|---|---|
| | | මූර්ත වත්කම් අත්කර ගැනීම නිර්මාණය සහ පවත්වාගෙන යාම | රාජ්‍ය නියෝජ්‍යත්වයන්ට දුන් ණය | එකතුව |
| 1959–60 | 1,365·4 | 440·1 | 55·6 | 495·7 |
| 1960–61 | 1,471·3 | 471·9 | 47·2 | 519·1 |
| 1961–62 (මුල් ඇස්තමේන්තු) | 1,450·3 | 580·6 | 59·9 | 640·5 |
| (නියම තාවකාලික) | 1,495·4 | 513·0 | 83·0 | 596·0 |
| 1962–63 (මුල් ඇස්තමේන්තු) | 1,585·4 | 560·5 | 9·8 | 570·3 |

සංඛ්‍යා— ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

තත්‍ය වර්තන වියදම් වල තාවකාලික සංඛ්‍යා අනුව, පසුගිය වසරට වඩා එය රුපියල් කෝටි 2·41 කින් වැඩි වී ඇති බැව් හෙළි වේ. 1960–61 දී මෙසේ වැඩි වූ ප්‍රමාණය, රුපියල් කෝටි 10·59 ක් වූ අතර, 1959/60 දී රුපියල් කෝටි 9·10 කින් වැඩි විය. 1961/62 දී වර්තන වියදම් එතරම් වැඩි නොවීමට ප්‍රධානතම හේතුව වූයේ ආහාර ආධාරය අඩුවීමය. පසුගිය වර්ෂ දෙකේ වර්තන වියදම වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ ආහාර ආධාරය සඳහා ගෙවූ මුදල වැඩි වීමය. විශ්‍රාම වැටුප්, රාජ්‍ය ණය පොලී, අධ්‍යාපනය, සඳහා වැඩි වූ වියදම්, ආහාර ආධාර වියදම් අඩුවීම නිසා තරමක් මැකී ගියේය.

1961/62 ආහාර ආධාර වියදම රු. කෝටි 23·54 ක් විය, මෙය, 1960/61 දී රුපියල් කෝටි 24·80 ක් ද 1959/60 දී රුපියල් කෝටි 19·30 ක් ද 1958/59 දී රුපියල් කෝටි 14·65 ක් ද විය. පිටි සහ සීනි වලින් ලැබුන රුපියල් කෝටි 3·89 ක ලාභය සහල් ආධාරය රුපියල් කෝටි 2·68 කින් වැඩිවීම නිසා තරමක් මැකී ගියේය. පිටි වෙළෙඳාමෙන් වැඩි ලාභයක් ලැබීමට හැකි වූයේ, 1961/62 අය–වැය ලේඛනයෙන් පිටි රාත්තලක මිල සත 23 සිට සත 28 තෙක් සත 5 කින් වැඩි කිරීමය. සීනි සම්බන්ධයෙන්, සුදු සීනි ගත් මිල බොහෝ සෙයින් අඩුවී ගිය නිසා 1961/62 දී ගෙන්වා බෙදු හරිනු ලැබූයේ සුදු සීනි පමණෙකි. සුදු සීනි කළු සීනිවලට වඩා සත 7 ක් වැඩි යෙන් විකුණන ලද නිසා, මෙයින් නිරායාසයෙන් ම වැඩි ලාභයක් ලැබිණි. 1961/62 අය–වැය ලේඛනයෙන් සුදු සීනි රාත්තලක සිල්ලර මිල සත 5 කින් වැඩි කරනු ලැබීය. එහෙත් 1961

---

1 වර්තන වියදම ලබා ගන්නේ නිදන් අරමුදල් දීමනා සහ ප්‍රාග්ධන ස්වරූපීය වියදම්, (නඩත්තු වියදම් සහ කල් පවත්නා භාණ්ඩ මිලට ගැනීම) පුනාවර්තන වියදම් වලින් (1, 2, 4 සහ 6 වැනි ශීර්ෂ) අඩු කිරීමෙනි.

2 ප්‍රාග්ධන වියදම් ලෙස සැලකෙන්නේ, අවුරුද්දකට වඩා වැඩි කාලයක් ප්‍රයෝජනයට ගත හැකි වත්කම්, නිර්මාණය ලබා ගැනීම හා නඩත්තුව සඳහා යන වියදම් සහ මූල්‍ය වත්කම් අත්කර ගැනීමේ වියදම් ය. මෙයට ප්‍රධාන වශයෙන් ලං.ග.ම. යට වරාය සංයුක්ත මණ්ඩලයට (ප්‍රාග්ධන කාර්යයන් සඳහා) දේශීය ණයවලට හා සංවර්ධන අරමුදලට දෙන ණය ගැනේ. ප්‍රාග්ධන වියදම්වලට සංවර්ධනයට නො ගැනෙන සමහර වියදම් ඇතුළත් වන නිසාත්, සංවර්ධනයට ගැනෙන සමහර වර්තන වියදම් ඇතුළත් නොවන නිසාත් ප්‍රාග්ධන වියදම් සංවර්ධන වියදම් හා සැසැඳෙන්නේ නොවේ. ප්‍රාග්ධන වියදම් වලට ප්‍රාග්ධන වැය ශීර්ෂ (3,5,සහ7) යටතේ ගැනෙන වියදම් ද, විදේශීය ආධාර, ණය සහ දීමනා වලින් වන වියදම් ද, වර්තන වියදම්වලට ප්‍රාග්ධන ශීර්ෂ, තේ හා රබර් නැවත වගා කිරීමේ ආධාර, විදුලි දෙපාර්තමේන්තුවේ සංචිත වියදම්, අධි අය-වැය ලේඛන වියදම් ගැනේ. අධි අය-වැය ලේඛන වියදම් 1959-60 කෝටි 3·89, 1960-61 කෝටි 2·83, 1961–62 කෝටි 3·36 (ඇස්තමේන්තු) සහ කෝටි 1·8 (තාවකාලික) සහ 1962–63 කෝටි 2·4 ක් ද විය.

දෙසැම්බරයේ දී නැවතත් පරණ මිලට ම වැටිණි. සහල් ආධාරය (පාරිභෝගික හා නිෂ්පාදන ආධාර) සඳහා වැඩි වූ වියදම පසුගිය අවුරුදු වලදීට වඩා අඩු විය. මෙයට හේතු වූයේ, සලාක සහල් විකිණීම අඩුවීමත් (රජයෙන්, සිල්ලර වෙළෙන්දන්ට) සහතික මිල ක්‍රමයකට ගත් වී ප්‍රමාණය පසුගිය අවුරුදු වලට වඩා අඩුවීමත් ය. සලාක සහල් විකිණීම අඩුවීමට එක් හේතුවක් වූයේ, සිල්ලර වෙළෙන්දන් විසින් රජයේ ප්‍රතිපත්තියට අනුව අඩුවෙන් තොග තබා ගැනීම විය. අනෙක් හේතුව වූයේ, 1961/62 අය-වැය ලේඛනයෙන් පනවන ලද සහල් සලාක පොත් ආධාර බද්දෙන් නිදහස් වීමට, ආදයම් බදු ගෙවන්නන් විසින් සලාක පොත් භාර දීමය.

1961/62 දී සහතික මිල ක්‍රමයකට ගනු ලැබූ වී ප්‍රමාණය බුසල් 2,50,65,890 ක් විය. මෙය සහල් වලින් ටොන් 3,41,032 ක් විය. 1960/61 දී ගත් ප්‍රමාණය ටොන් 3,26,272 ක් වූ අතර 1959/60 දී ගත් ප්‍රමාණය ටොන් 2,70,000 ක් විය.

බුරුම සහල් මෙරටට ගොඩබාන විට, ටොන් එකක් රු. 535/– ක් විය. පසුගිය අවුරුද්දේ ටොන් එකක මිල රුපියල් 530/– ක් විය. පිටි ගෙන්වනු ලබන ප්‍රධාන රට වන ඕස්ට්‍රේලියාවෙන් ගෙන් වන ලද පිටි වල මිල පසුගිය වසරේ මිල මට්ටමේම පැවැතිණි. පසුගිය වසරේ සුදු සීනි ටොන් එකක් ගොඩබෑමේ දී රුපියල් 565/– ක් වුව ද, 1961/62 දී එය රුපියල් 500/– තෙක් අඩු විය.

### ප්‍රාග්ධන වියදම

1961/62 මුළු ප්‍රාග්ධන වියදම, රුපියල් කෝටි 59·60 ක් විය. පසුගිය වසරට වඩා මෙය රුපියල් කෝටි 7·69 කින් වැඩිය. රජයේ නියෝජ්‍යත්වයනට දෙන ලද ණය, රුපියල් කෝටි 3·58 කින් වැඩි වූ අතර, මූර්ත වත්කම් ලබා ගැනීම, ඉදි කිරීම හා නඩත්තුව, සඳහා වූ වියදම්, රුපියල් කෝටි 4·11 කින් වැඩි විය. ලැබී ඇති සංඛ්‍යා තොරතුරු අනුව වියදම් වැඩිවී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම පොදු කාර්යයන් හා කෘෂිකර්මාන්තයට ද වාරිමාර්ග හා ධීවර කර්මාන්තයටද බව හෙළි වේ.

### හිඟය පියවීම

1961/62 අයවැය හිඟය පියවා ගැනීමට මුදල් ලබාගත් මාර්ගයන් සහ ඉන් ඇති වූ ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම ද, පසුගිය වසරේ සමානුරූප සංඛ්‍යා සමග පහත සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II උ—4

#### හිඟය පියවූ ආකාරය

රුපියල් දශ ලක්ෂ

| | 1960/61 | | | 1961/62 (තාවකාලිකයි) | | |
|---|---|---|---|---|---|---|
| 1. පරිපාලන ණය ගැනීම .. .. .. | | | 29·4 | | | 104·5 |
| 2. විදේශ මුදල් (අ) ණය .. .. .. | | | | | | |
| (1) ණයට ගත් ප්‍රමාණය (දළ) .. | 16·3 | | | 44·5 | | |
| (2) නැවත ගෙවීම් හැර .. | 3·0 | 13·3 | | 5·3 | 39·2 | |
| (ආ) දීමනා .. .. .. | | 13·3 | 26·6 | | 19·0 | 58·2 |
| 3. බැංකු-නොවන, දේශීය වෙළෙඳ පොළෙන් ගත් ණය .. | | | | | | |
| (අ) ණයට ගත් ප්‍රමාණය දළ වශයෙන් .. .. | | 197·3 | | | 147·3 | |
| (ආ) නිදන් අරමුදල් දීමනා හැර .. .. .. | | 32·1 | 165·2 | | 39·5 | 107·8 |
| 4. දේශීය වෙළෙඳ පොළේ බැංකු ක්‍රමයෙන් ගත් ණය .. | | | 241·4 | | | 226·6 |
| 5. රජයේ මුදල් ශේෂ අඩුවීම (–ලකුණ වැඩිවීමෙක් දක්වයි) | | | නැත | | | –40·2 |
| 6. ශුද්ධ—අයවැය හිඟය .. .. .. .. | | | 462·5* | | | 456·9 |
| 7. එක්සත් ජනපදයේ ප්‍රතිපාර්ශවිය අරමුදල් අඩුවීම (—ලකුණ වැඩිවීමෙක් දක්වයි) .. | | | —7·5 | | | 4·0 |
| 8. අයවැය ලේඛනයේ ශුද්ධ ප්‍රාසාරණාත්මක බලපෑම .. (4+5+7) | | | 233·9 | | | 190·4 |

සංඛ්‍යා— ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* 1960–61 සිට අයවැය ලේඛනයට එකතු කළ විදේශ දීමනා වලින් වැය කැරෙන, ප්‍රාග්ධන වියදම් ඇතුළු කොට සංශෝධිතය.

මුලින් ඇස්තමේන්තු කළ ශුද්ධ අය–වැය හිඟය වූ රුපියල් කෝටි 28·05 පියවීම සඳහා දේශීය වෙළෙඳ පොළෙන් රුපියල් කෝටි 16·2*ක ණයක් ලබා ගැනීමට ද, විදේශාධාර වලින් රුපියල් කෝටි 12·9 ක් ලබා ගැනීමට ද අය–වැය ලේඛනයෙන් අදහස් කළේ ය. මේ වාර්තාවේ ඉහත සඳහන් හේතු නිසා තත්‍ය වශයෙන් ම ඇතිවූ අය–වැය හිඟය රුපියල් කෝටි 45·69ක් විය. බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් මේ හිඟය වැඩිවීමත්, දේශීය වෙළෙඳ පොළෙන් ලැබුණ ණය අඩුවීමත් නිසා බැංකු ක්‍රමයෙන් සැහෙන ප්‍රමාණයක ණය ගැනීමට සිදු විය. එහෙත් රජයේ මුදල් හා සමායතන වල වැය නොකළ මුදල් ශේෂ හා භාණ්ඩාගාරයේ තැන්පත් කිරීම නිසා (ඉහත පරිපාලන ණය ගැනීම් බලන්න) බැංකු වලින් ගැනීමට සිදු විය හැකිව තිබුණ ණය ප්‍රමාණය එපමණට ම වැඩි වූයේ නොවේ.

මේ අනුව, එක්සත් ජනපදයේ ප්‍රතිපාර්ශීවිය අරමුදල් යොදවා ගැනීම නිසා අය–වැය ලේඛනයේ ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම පසුගිය මුදල් වර්ෂයේ පැවැති බලපෑමට වඩා අඩු විය. 1960/61 බලපෑම රුපියල් කෝටි 23·39 ක් වූ අතර, මේ වසරේ එය රුපියල් කෝටි 19·04 ක් විය. 1959/60 වසරේ දී එය රුපියල් කෝටි 25·11 ක් වී තිබිණි.

බැංකු වලින් ණයට ගනු ලැබූ රුපියල් කෝටි 22·66 න් රුපියල් කෝටි 16·2 ක් මහ බැංකුවෙන් ලබා ගත් අතර, වෙළෙඳ බැංකු වලින් ලබා ගත් ප්‍රමාණය රුපියල් කෝටි 6·45 ක් විය. කෙළින් ම දෙන ලද මහ බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 2·1 කින් අඩු විය. මහ බැංකුව, විසින් මිලයට ගනු ලැබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 18·39 ක් වූ අතර වෙළෙඳ බැංකු රුපියල් කෝටි 4·2 ක භාණ්ඩාගාර බිල්පත් ගනු ලැබීය. රුපියල් ණය රුපියල් කෝටි 2·31 ක් විය. ඔවුන් සතු බදු සංචිත සහතික රුපියල් කෝටි 0·06 කින් අඩු විය. 1960/61 වෙළෙඳ බැංකු විසින් රජයේ සුරකුම්පත් වල ආයෝජනය කැරුන මුළු ප්‍රමාණය රුපියල් කෝටි 3·71ක් විය. මෙයින් හා භාණ්ඩාගාර බිල්පත් වල රුපියල් කෝටි 3·73 ක් ද බදු සංචිත සහතිකවල කෝටි 0·13 ක් ද යෙදු වූ අතර, රුපියල් සුරකුම්පත් වල යෙදු වූ ප්‍රමාණය රුපියල් කෝටි 0·15 කින් අඩු වී ගියේ ය.

මුදල් වර්ෂය ආරම්භයේ දී බෙහෙවින් අඩු වී තුබූ රජයේ මුදල් ශේෂ රුපියල් කෝටි 4·02 කින් වැඩි විය.

1961/62 දී ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණ විදේශාධාර රුපියල් කෝටි 6·35 ක් විය. 1960–61 දී මෙය රුපියල් කෝටි 2·96 ක් වූ අතර, 1959/60 දී මේ සඳහා රුපියල් කෝටි 3·86 ක් ලැබිණි. මේ තෙවස තුළ දී ගෙවන විදේශ ණය ප්‍රමාණයන් පිළිවෙළින් රුපියල් කෝටි 0·53, 0·3 ක් සහ 0·27 ක් විය. අයවැය ලේඛනයෙන් බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා ලැබුණ විදේශාධාර අඩු වුවද, ලැබුණ ආධාර වලට සමානව, ප්‍රාග්ධන වියදම් කැරුණ කල්හි හිඟය පියවීම සම්බන්ධ

* අයවැය ඇස්තමේන්තු අනුව, සංඛ්‍යා පිළිවෙළින්, රු. කෝටි 32·94, රු. කෝටි 20 සහ රු. කෝටි 14 ක් විය. රු. කෝටි 28·05 රු. කෝටි 16·2 සහ රු. කෝටි 12·9 යන සංඛ්‍යා ලබා ගත්තේ, ශුද්ධ අය-වැය හිඟය සැකැසීමේ දී වියදම් වශයෙන් ඇතුළත් කොට නොමැති නිදන් අරමුදල් දීමනා වන රු. කෝටි 3·8 ක් සහ විදේශ ණය නැවත ගෙවීමට යෙදු වූ රුපියල් කෝටි 1·09 ක් අඩු කර ගැනීමෙනි.

යෙන් ඇති වූ වෙනස එතරම් නොවී ය. උපකරණ වලින් ආධාර ලැබුණ අවස්ථාවල දී මෙය විශේෂයෙන් ම ඇති විය. 1961/62 දී ලැබුණ විදේශාධාර විස්තර පහත දක්වේ:—

සංඛ්‍යා සටහන II උ—5

**ණය**

රුපියල් දශ ලක්ෂ

| | ණයට ගත් ප්‍රමාණය | ගෙවන ලද ප්‍රමාණය | ලැබුණ ප්‍රමාණය ශුද්ධ |
|---|---|---|---|
| ජාත්‍යන්තර, ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුව .. .. | 29·5 | 3·9 | 25·6 |
| කැනඩාව .. .. .. .. .. .. | — | 0·3 | — 0·3 |
| චීනය .. .. .. .. .. .. | — | 1·0 | — 1·0 |
| එක්සත් රාජධානිය .. .. .. .. .. | 3·3 | — | 3·3 |
| ඇමෙරිකා එක්සත් ජනපදය .. .. .. .. | 8·2 | — | 8·2 |
| එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව .. .. | 3·4 | — | 3·4 |
| | 44·5 | 5·3 | 39·2 |

**දීමනා:**

| | | |
|---|---|---|
| කොළඹ ක්‍රමය : | | |
| (1) ඕස්ට්‍රේලියාව .. .. .. .. | — | |
| (2) කැනඩාව .. .. .. .. | 5·2 | |
| (3) නවසීලන්තය .. .. .. .. | — | |
| | | 5·2 |
| චීනය .. .. .. .. .. | | 8·3 |
| ජර්මනිය .. .. .. .. .. | | 4·8 |
| ඇමෙරිකා එක්සත් ජනපදය .. .. .. | | 0·8 |
| | | 19·0 |

සංඛ්‍යා —ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1960/61 බැංකු නොවන දේශීය වෙළෙඳ පොළෙන් ගත් ණය ප්‍රමාණය රුපියල් කෝටි 16·52 ක් වුවද, 1961–62 දී මේ මාර්ගයෙන් ගත් ණය රුපියල් කෝටි 10·78 තෙක් සෑහෙන ප්‍රමාණයකින් අඩු විය.

රජයේ සුරැකුම් පත් වල මුදල් යෙදවීමට දක්වූ අඩු උනන්දුව, ආයතන සහ ආයතන නොවන ආයෝජකයන් කෙරෙහි ද බලපාමින් පැතිරී ගියේය. රජයේ සුරැකුම්පත් වල මුදල් යෙදවීමට උනන්දුව දක්වූයේ සමහර විට සේවක අර්ථ සාධක මුදල පමණක් විය හැකිය. සේවක අර්ථ සාධක අරමුදල සුරැකුම්පත් වල යෙදවූ වාර්ෂික ආයෝජනය රුපියල් කෝටි 0·4 කින් වැඩි විය. 1960–61 දී රුපියල් කෝටි 5·55 ක් වූ මෙය 1961/62 වසරේ දී රුපියල් කෝටි 5·94 තෙක් වැඩි විය. අනෙකුත් ප්‍රධාන ආයෝජක පංති අතර ඇති වූ වෙනස්කම් පහත දක්වේ:—

සංඛ්‍යා සටහන II උ—6

රුපියල් දශ ලක්ෂ

| | 1960/61 | 1961/62 | ශුද්ධ වෙනස |
|---|---|---|---|
| 1. ඉතිරි කිරීමේ ආයතන .. .. .. .. | 22·8 | 12·5 | —10·3 |
| 2. අර්ථ සාධක සහ විශ්‍රාම වැටුප් අරමුදල් (සේවක අර්ථ සාධක අරමුදල හැර) .. .. .. | 33·7 | 25·0 | — 8·7 |
| 3. රක්ෂණ සමාගම්.. .. .. .. .. .. | 15·2 | 10·1 | — 5·1 |
| 4. අනෙකුත් සමාගම් .. .. .. .. .. | 10·4 | — 7·4 | —17·8 |
| 5. සමාජ සහ ආයතන .. .. .. .. .. | 15·1 | — 1·4 | —16·5 |
| 6. පුද්ගලයන් .. .. .. .. .. .. | 2·5 | 1·7 | — 0·8 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

බැංකු නොවන ආයෝජකයන් විසින්, රජයේ ණයපත් වල මුදල් යෙදවීමට 1961-62 දී දක්වන ලද අඩු උනන්දුව, එම වසරේ ක්‍රියාත්මක වෙමින් තුබුණ විශේෂ අවස්ථා සමහරක් නිසා ඇතිවිනැයි කිව හැකිය. 1960/61 දී වෙළෙඳ බැංකුවල තැන්පත්ව තුබූ පුද්ගලයන් සතු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 0·2 කින් අඩු වුවද, 1961/62 දී එය රුපියල් කෝටි 4·27 කින් වැඩි විය. මේ අනුව බැංකු නොවන මාර්ග වලින් රජයේ ණයපත් වල කැරුන ආයෝජන අඩුවූයේ, ඉතිරි කිරීම් පොදුවේ අඩුවී ගිය නිසා යැයි කිවහැක්කේ නොවේ. එක් අතකින්, රජයේ ණයපත් වල මුදල් නොයොදවා ඒ වෙළෙඳ බැංකු වල, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතුවල යෙදවූ බව වෙළෙඳ බැංකුවල මේ වර්ගයේ තැන්පතු වැඩිවීමෙන් හෙළි වෙයි. 1961 සැප්තැම්බර් මාසයේ දී බොහෝ වෙළෙඳ බැංකු රුපියල් 25,000 ට හා ඊට වැඩි ස්ථාවර තැන්පතු සඳහා දෙන පොළී ප්‍රමාණය සියයට 3 තෙක් වැඩි කළේය.

ව්‍යාපාර සම්බන්ධයෙන් පැවැති අවිනිශ්චිතතාවත්, සමහර විට සේවකයන් අස් කිරීමට පවා සිදුවිය හැකි වූ ආනයන පාලනයත්, නිසා සමාගම්, අර්ථසාධක සහ විශ්‍රාම වැටුප් අරමුදල්, අමතර වශයෙන් ද්‍රවශීල වත්කම් තබා ගැනීමේ අදහසින් මුදල් දිගුකාලීන වශයෙන් ආයෝජන නොකොට කාලීන තැන්පතු ලෙස ආයෝජන කළා විය හැකිය. පෞද්ගලික රක්ෂණ සමාගම් 1962 ජනවාරි 1 වැනිද සිට අලුත් ව්‍යාපාර ඇරැඹීම නතර කරන ලදී. මෙදිනම වැඩ ඇරැඹූ රජයේ රක්ෂණ සමායතනය කාරක ප්‍රාග්ධනයක් සහ, ද්‍රවශීල සංචිතයක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවය නිසා මේ මාර්ගයෙන් ලැබුණ අරමුදල් එලෙසම තබා ගැනීමේ අවස්ථාවක සිටියේ නොවේ. එමනිසා මේ මාර්ගයෙන් ලැබුණ අරමුදල් තාවකාලිකව පහළ වැටීම නොවැළැක්විය හැකි විය. අවුරුද්දේ මුල් කොටසේ දී බැංකු කටයුතු පිළිබඳ පැවැති අවිනිශ්චිතතාවය නිසා බැංකු ණයපහසුකම් තාවකාලිකව අත්හිටවීමද, රජයේ ණයපත් වල මුදල් යෙදවීමේ උනන්දුව, අඩු වී යාමට හේතුවූවා විය හැකිය.

පරිපාලන ණය ගත් මාර්ග අතර, ගෙවීමට ඇති මුදල් ඇණවුම්, අරමුදල් (රුපියල් කෝටි 1·79) ලංකා ගමනා ගමන මණ්ඩලය (රුපියල් කෝටි 2·2) සහ රජයේ අනෙකුත් ආයතන (රුපියල් කෝටි 5·08) ප්‍රධාන විය.

**රාජ්‍ය ණය (1)**

දේශීය හා විදේශීය රාජ්‍ය ණය පිළිබඳ සංඛ්‍යා තොරතුරු 23 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. (II වැනි පරිශිෂ්ටය බලන්න) පසුගිය මුදල් වර්ෂ පහේ, එක්-එක් වර්ෂයේ අවසානයට තුබූ මුළු රාජ්‍ය ණය ප්‍රමාණයන් පහත දැක්වේ:—

සංඛ්‍යා සටහන II උ—7

**මුළු රාජ්‍ය ණය**

රුපියල් දශ ලක්ෂ

| සැප්තැම්බර් අවසානයේ දී | දළ | ශුද්ධ (නිදන් අරමුදල් වටිනාකම් අඩු කොට) |
|---|---|---|
| 1958 .. .. .. | 1,495·4 | 1,212·1 |
| 1959 .. .. .. | 1,837·0 | 1,524·7 |
| 1960 .. .. .. | 2,230·4 | 1,912·8 |
| 1961 .. .. .. | 2,651·0 | 2,332·7 |
| 1962 .. .. .. | 3,037·8 | 2,686·1 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

(1) මේ රාජ්‍ය ණය සංඛ්‍යාවලට, 1962 සැප්තැම්බර් මාසය අවසානයේ දී තුබූ රුපියල් කෝටි 7 ක ජාතික නිවාස ණයකර සහ රුපියල් කෝටි 4·58 ක රජයේ උකස් බැංකු ණයකර ද ඇතුළත් නොවේ.

1961/62 වර්ෂයේදී දළ ණය රුපියල් කෝටි 38·68 කින් ද, ශුද්ධ ණය රුපියල් කෝටි 35·34 කින් ද වැඩි විය. 1960/61 දී මේ ණය පිළිවෙළින් රුපියල් කෝටි 42·06 කින් හා රුපියල් කෝටි 41·99 කින් වැඩිවී ඇත. රුපියල් කෝටි 38·68 කින් වැඩි වූ දළ ණය රුපියල් කෝටි 11·87 කින් වැඩි වූ රුපියල් සුරැකුම්පත් වලින් ද, රු. කෝටි 25·00 කින් වැඩි වූ භාණ්ඩාගාර බිල්පත් වලින් ද, රුපියල් කෝටි 0·19 කින් වැඩි වූ බදු සංචිත සහතික වලින් ද, රුපියල් කෝටි 3·71 කින් වැඩිවූ විදේශීය ණය වලින් ද, සමන්විත විය. මහ බැංකු අත්තිකාරම් වලින් රුපියල් කෝටි 2·09 ක් ආපසු ගෙවන ලදී.

### රුපියල් සුරැකුම්පත්

පසුගිය පස්වසර තුළ ගන්නා ලද ණය සහ ගෙවන ලද ණය පහළ සටහනේ දැක්වේ:—

සංඛ්‍යා සටහන II උ—8

(රුපියල්)

| මුදල් වර්ෂය | ගන්නා ලද ණය | ගෙවන ලද ණය |
|---|---|---|
| 1957–58 .. .. .. | 7,94,74,400 | 5,61,43,700 |
| 1958–59 .. .. .. | 12,04,16,800 | 3,50,25,200 |
| 1959–60 .. .. .. | 19,50,00,000 | 5,52,39,200 |
| 1960–61 .. .. .. | 26,95,83,200 | 8,97,48,800 |
| 1961–62 .. .. .. | 19,36,99,600 | 7,50,00,000 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

1961/62 මුදල් වර්ෂයේ දී රුපියල් සුරැකුම් පත් දස වරක් නිකුත් කොට ණය ලබාගන්නා ලදී. මෙයින් 1965/67 සියයට 3¼ ණය ද, 1967/72 සියයට 3½ ණයද, 1983/87 සියයට 4¼ "බී" කාණ්ඩයේ ණය ද, මේ අවුරුද්දේ කල් පිරෙන, 1960/62 සියයට 2½ රුපියල් කෝටි 4·87 ණය හැරවීමෙන් ලබා ගැනීමට නිකුත් කැරිණි. කල්පිරෙන ණයෙන් රුපියල් කෝටි 4·17 ක කොටස්, අලුත් ණය තුනේ කොටස්වලට ගෙවීමට පවරා දෙන ලදී. ශෙෂය මත රු. කෝටි 0·7 මුදලින් ලැබිණි.

කෙළින්ම මුදලින් ගනු ලැබූ අනෙක් ණය හත මෙසේ ය:—

1961 ඔක්තෝබරයේ ගත් සියයට 4¼, 1982/86 'ජී' කාණ්ඩයේ ණය

1961 දෙසැම්බරයේ ගත් සියයට 4¼, 1982/86 'එච්' කාණ්ඩයේ ණය

1962 පෙබරවාරියේ දී ගත් සියයට 4¼, 1983/87 ණය

1962 මැයිවල දී ගත්, සියයට 4¼, 1983/87 'සී' කා ණ්ඩයේ ණය

1962 ජූනි–ජූලි වලදී ගත් සියයට 4¼, 1983/87 'ඩී' කාණ්ඩයේ ණය

1962 අගෝස්තු–සැප්තැම්බර් වලදී ගත් සියයට 4¼, 1983/87 'ඊ' කාණ්ඩයේ ණය සහ සියයට 3¼, 1965/67 'බී' කාණ්ඩයේ ණය, මෙම ණය වලින් බලාපොරොත්තු වූ මුළු මුදල වන රුපියල් කෝටි 19·37 සම්පූර්ණයෙන්ම ලැබිණි. මේ ණය ලැබුණු මාර්ග වර්ග කොට II උ—9 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II උ—9

## 1961/62 රජයේ සුරැකුම් පත් බෙදී ගිය අයුරු

රුපියල් දශ ලක්ෂ

| | 1982–86 'ජී' කාණ්ඩයේ සියයට 4¼ ණය | 1982–86 'එච්'කාණ්ඩයේ සියයට 4¼ ණය | 1983–87 සියයට 4¼ ණය | 1965–67 † සියයට 3¼ ණය | | 1967–72† සියයට 3½ ණය | | 1983–87 † කාණ්ඩයේ සියයට 4¼ ණය | | 1983–87 'සී' කාණ්ඩයේ සියයට 4¼ ණය | 1983–87 'ඩී' කාණ්ඩයේ සියයට 4¼ ණය | 1965–67 'බී' කාණ්ඩයේ සියයට 3¼ ණය | 1983–87 'ඊ' කාණ්ඩයේ සියයට 4¼ ණය | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පුනරායෝජන * | මුදල් | පුනරායෝජන * | මුදල් | පුනරායෝජන * | මුදල් | | | | | ප්‍රමාණය | සියයට ගණන |
| වෙළෙඳ බැංකු .. .. .. | — | — | — | 19·6 | 5·3 | 14·9 | 0·1 | — | — | — | — | 23·3 | — | 63·2 | 32·6 |
| සමූපකාර ප්‍රාදේශීය බැංකු .. .. | 0·1 | 0·3 | — | — | — | — | — | — | — | — | — | — | 0·2 | 0·6 | 0·3 |
| ඉතිරි කිරීමේ ආයතන .. .. .. | 1·3 | 3·6 | 0·3 | — | — | — | — | 1·1 | — | 2·3 | 4·0 | — | 1·4 | 14·0 | 7·2 |
| නිදන් අරමුදල් .. .. .. | 4·9 | 5·3 | 6·2 | — | — | — | — | — | — | — | — | — | — | 16·4 | 8·5 |
| දෙපාර්තමේන්තු සහ අනෙකුත් කාර්යාලයීය අරමුදල් .. .. .. | 1·3 | 2·2 | ... | — | — | — | — | 0·9 | — | 0·5 | 1·1 | — | — | 6·0 | 3·1 |
| භාරකාර මණ්ඩල, අර්ථ සාධක දීමනා හා විශ්‍රාම වැටුප් අරමුදල්.. .. .. | | | | | | | | | | | | | | | |
| (1) සේවක අර්ථ සාධක අරමුදල | 6·0 | 8·5 | 7·9 | — | — | — | — | — | 0·3 | 15·0 | 10·6 | — | 5·7 | 54·0 | 27·9 |
| (2) අනෙකුත් .. .. .. | 5·6 | 4·5 | 4·1 | 0·4 | — | 0·1 | ... | 1·7 | 0·2 | 1·8 | 2·8 | 2·6 | 2·9 | 26·7 | 13·8 |
| රක්ෂණ සමාගම් .. .. .. | 0·6 | 0·6 | 1·5 | 0·9 | 0·3 | ... | 1·4 | — | — | 0·3 | 1·4 | 1·8 | 1·5 | 10·3 | 5·3 |
| අනෙකුත් සමාගම් .. .. .. | — | — | — | 0·1 | — | — | — | — | — | — | — | 0·1 | ... | 0·2 | 0·1 |
| පුද්ගලයන්, සමාජ හා ආයතන .. .. | 0·2 | 0·2 | 0·1 | 0·1 | ... | — | — | 1·4 | — | 0·1 | 0·1 | ... | 0·5 | 2·7 | 1·4 |
| එකතුව .. | 20·0 | 25·0 | 20·0 | 21·0 | 5·6 | 15·0 | 1·5 | 5·1 | 0·5 | 20·0 | 20·0 | 27·9 | 12·1 | 193·7 | 100·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* 1960–62 කල්පිරෙන සියයට 2½ ණය මුදල් නව නිකුතුවල ආයෝජනය කිරීම

† හැරවුම් ණය

**භාණ්ඩාගාර බිල්පත්**

මෑත මුදල් වර්ෂවලදී මෙන්ම 1961/62 දී ද වැඩිවූ රාජ්‍ය ණය ප්‍රධාන වශයෙන්ම සමන්විත වූයේ වැඩිවූ භාණ්ඩාගාර බිල්පත් වලිනි. 1961 සැප්තැම්බර් මාසය වනවිට නොබේරා තුබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 75·0 ක් වූ අතර 1962 සැප්තැම්බර් මාසය වන විට මෙය රුපියල් කෝටි 100·0 තෙක් වැඩි විය. වැඩිවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රධාන වශයෙන් ම ගනු ලැබුයේ මහ බැංකුව විසිනි. 1962 සැප්තැම්බර් අවසානයට මහ බැංකුව සතුව තුබූ භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රුපියල් කෝටි 86·44 ක් විය. 1961 සැප්තැම්බර් අවසානයේ දී මෙය රුපියල් කෝටි 68·0 ක්ව තිබිණි.

1961/62 මුදල් වර්ෂය තුළ, භාණ්ඩාගාර බිල්පත් සඳහා බලය ලත් සීමාව 1961 දෙසැම්බර් 14 වැනි දින පාර්ලිමේන්තු සම්මුතියකින් රුපියල් කෝටි 75·0 සිට රුපියල් කෝටි 100 දක්වා වැඩි කළේ ය.

**විදේශ ණය**

විදේශ ණය රුපියල් කෝටි 3·76 කින් වැඩිවිය. මේ සැදුනේ විදේශ ණය ගිවිසුම් යටතේ රුපියල් කෝටි 4·45 ලැබුණ ද, රුපියල් කෝටි 0·39 ක ජා. ප්‍ර. ස. බැ. ණයක් ද, රුපියල් කෝටි 0·1 ක චීන ණයක් ද, රුපියල් කෝටි 0·13 ක කැනේඩියානු ණයක් ද, රුපියල් කෝටි 0·07 ක ජා. ස. ස. ණයක් ද බේරාලූ බැවිනි. විදේශ වලින් ගත් මුළු ණය ලැබුණ මාර්ග අනුව වර්ගකොට II උ—10 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II උ—10

**විදේශීය ණය**

රුපියල් දශ ලක්ෂ

| | 1961–62 ශුද්ධ වැඩිවීම | 1962 සැප්තැම්බර් 30 දිනට නොගෙවා තිබූ ශේෂය |
|---|---|---|
| ජා. ප්‍ර. ස. බැ. | 25·6 | 102·1 |
| කැනේඩියානු ණය | —1·3 | 8·4 |
| චීන ණය | —1·0 | 9·3 |
| එ. රා. ණය | 3·3 | 3·3 |
| එ.ර. රන්පවුම් සුරකුම්පත් | — | 167·9 |
| ඇ. එ. (සංවර්ධන අරමුදල) | 3·9 | 13·3 |
| ඇ. එ. (අයි.සී.ඒ.) | 3·7 | 31·7 |
| එ. ස. සෝ. ස. | 3·4 | 8·8 |
| | 37·6 | 344·8 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

**නිදන් අරමුදල්**

රාජ්‍ය ණය බේරීම සඳහා ඇති නිදන් අරමුදලේ වටිනාකම, 1961–62 අවසානය වන විට, රුපියල් කෝටි 35·18 ක් ව තිබිණි. 1960–61 අවසානයට තුබූ සංඛ්‍යා සහ සසඳන විට මෙය රුපියල් කෝටි 3·35 කින් වැඩිවීමෙකි. 1962 කල් පිරුන, 1960–62 සියයට 2½ ජාතික සංවර්ධන ණය බේරීම සඳහා රුපියල් කෝටි 2·63 මෙයින් ගන්නා ලදී. අයවැය ලේඛනයෙන් නිදන් අරමුදලට වෙන් කළ මුදල රුපියල් කෝටි 3·79 ක් වූ අතර, ආයෝජන පොළී වශයෙන් ලැබුන මුදල රුපියල් කෝටි 1·2 ක් විය. නිදන් අරමුදල සතු වත්කම්වල වෙළෙඳ වටිනාකම රුපියල් කෝටි 0·98 ක වැඩිවීමෙක් පෙන්වීය.

**අර්ධ රාජ්‍ය ආයතන විසින් ගත් ණය** :—1961–62 දී ජාතික නිවාස ණයකර, නිකුත් කොට, ණය ගත්තේ නැත. එහෙත් වසර තුළ දී රජය විසින් ජාතික නිවාස කොමසාරිස් තැනට, කෙලින්ම රුපියල් කෝටියක ණයක් දෙනු ලැබිය. මේ සමග රජයෙන් ජාතික නිවාස කොමසාරිස්ට මෙසේ දෙනලද ණය ප්‍රමාණය රුපියල් හාරකෝටියක් විය. ජාතික නිවාස ණයකර පිට ගෙන මෙතෙක් නොබේරා ඇති මුළු ණය ප්‍රමාණය රුපියල් හත් කෝටියක් විය. ජාතික නිවාස ණය කර බේරීම සඳහා අරඹා ඇති නිදන් අරමුදලේ නියම වෙළෙඳ වටිනාකම මුදල් වර්ෂය අවසාන වන විට රුපියල් කෝටි 1·55 ක් විය.

1961–62 දී රජයේ උකස් බැංකු ණයකර නිකුත්කොට ණය ගත්තේ ද නැත. උකස් බැංකුවේ කටයුතු සඳහා වෙළෙඳ බැංකු වලින් තවදුරටත් අයිරාවන් පිට මුදල් ගනු ලැබීය. 1960–61 බැංකුවට ණය ගත හැකි වැඩිම සීමාව රුපියල් කෝටි හයක් වුවද රජයේ උකස් බැංකු පනතේ 35 වැනි වගන්තියට අනුව මුදල් ඇමතිතුමා විසින් 1962 මාර්තු මාසයේ දී මේ සීමාව රුපියල් හය කෝටි පනස් ලක්ෂය තෙක් වැඩි කරනු ලැබීය. ණයකර උඩ ලබාගෙන 1962 සැප්තැම්බර් 30 වැනි දිනට නොබේරා තුබූ ණය ප්‍රමාණය රුපියල් කෝටි 4·58 ක්වූ අතර ඇප පිට ගත් අයිරාවන්ගෙන් නොබේරා තුබූ ප්‍රමාණය රුපියල් කෝටි 0·93 ක් විය.

**1962–63 අයවැය ලේඛණය**

1962–63 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවෙන් සම්මත කළ ආදයම් හා වියදම් පිළිබඳ මුල් ඇස්තමේන්තු පහළ දැක්වේ :—

සංඛ්‍යා සටහන II උ—11

## 1962-63 මුල් අය-වැය ඇස්තමේන්තු

රුපියල් දශ ලක්ෂ

| | |
|---|---|
| ආවර්තන වියදම් (වැය ශීර්ෂ 1, 2, 4 සහ 6) | 1706·9 |
| ප්‍රාග්ධන වියදම් (වැය ශීර්ෂ 3, 5 සහ 7) | 473·3 |
| මුළු වියදම | 2180·2 |
| ආදයම | —1716·9 |
| අය–වැය හිඟය | 463·3 |
| නිදන් අරමුදල් දීමනා සහ අවක්‍ර රාජ්‍ය ණය බේරීම් හැර | 50·0 |
| ඇස්තමේන්තු කළ ශුද්ධ අය–වැය හිඟය | 413·3 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

රුපියල් කෝටි 46·33 ක්ව පැවැති අය–වැය හිඟය පියවීමේ මාර්ග වශයෙන් මුදල් ඇමතිතුමා විසින් දේශීය වෙළෙඳ පොළෙන් රුපියල් කෝටි 18 ක ණයක් ද, විදේශාධාර වලින් රුපියල් කෝටි 15 ක් ද ලබා ගැනීමට සඳහන් කැරිණ. එහෙත් රුපියල් කෝටි 13·33 ක නොපියවුන හිඟයක් විය.

අයවැය කතාවෙන් දැක්වුන යෝජනා දෙකක් වන රුපියල් කෝටි 9 ක ආදයමක් ලැබීමට ඇස්තමේන්තු කළ අලෙවි බද්දත්, ආහාර ආධාරයට යන වියදමින්, රුපියල් කෝටි 2·55 ඉතිරි කර ගැනීමට ඇස්තමේන්තු කළ, එක් අයකුගේ හාල් සලාකය රාත්තලකින් අඩු කිරීමේ යෝජනාවක් පසුව අස් කර ගන්නා ලදී. අලෙවි බද්ද වෙනුවට පිටරටින් ගෙන්වන බොහෝ භාණ්ඩ සඳහා පැවැති තීරු බදු සියයට 20 කින් වැඩි කළේ, ඉන් රුපියල් කෝටි 5 ක ආදයමක් ලැබෙතැයි බලාපොරොත්තු විය.

ඊටපසු මුදල් ඇමතිතුමා විසින් 1963 පෙබරවාරි 21 වැනි දින පාර්ලිමේන්තුවේ කැරුන කතාවකින් අලුත් මුදල් විධිවිධාන සමහරක් ප්‍රකාශයට පත් කරන ලදී.

අළුත් විධිවිධාන මෙසේය :—

(අ) වී වගා කරන්නන්ගෙන් සහල් සලාක කූපන් කපා ගැනීමෙන් රුපියල් කෝටි 4·0 යි.

(ආ) උම්බලකඩ ආධාරය අස්කර ගැනීමෙන් රුපියල් කෝටි 0·5 යි.

(ඇ) ආනයන බලපත්‍ර සඳහා සියයට එකක ගාස්තුවෙන් රුපියල් කෝටි 0·6 යි.

(ඈ) ආහාර කොමසාරිස් වරයාගේ දෙපාර්තමේන්තුවෙන් කැරෙන අනෙකුත් පිරිමැස්ම වලින් රුපියල් කෝටි 1 යි.

ආහාර කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුවෙන් සකසා ගනු ලැබූ පිරිමැසීම මෙසේය:—

(අ) සමහර පලාත්වලට සහල් වෙනුවට වී දීමෙන් සහ

(ආ) කොළඹ සිට යන ගමන් ගාස්තුව එකතු කොට, සහල් මිල, පිටි මිල හා සීනි මිල දිවයින පුරාම සංශෝධනය කිරීමෙන්

වී නිපදවන්නන්ගෙන් කූපන් කපා ගැනීමේ ක්‍රමය අත්හිටවන බව වාණිජ, වෙළෙඳ ආහාර හා නැව්කටයුතු පිළිබඳ ගරු ඇමැතිතුමා විසින් 1963 මාර්තු මස 8 වැනි දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන ලදී.

1963 පෙබරවාරි 15 වැනි ද සිට සීනි රාත්තලක් විකුණන මිල ද සත 5 කින් වැඩි කැරිණි. සීනි මෙරටට ගෙන්වන මිල වැඩි වූ නිසා මෙයින් ආහාර ආධාරයට යන වියදම අඩු වෙතැයි අපේක්ෂා නොකැරිණි.

### ආදායම

අයවැය ලේඛනයෙන් යෝජිත අලුත් බදු වලින් ලැබෙන රුපියල් කෝටි 9·45 ක් ද ඇතුළුව මුලින් ඇස්තමේන්තු කළ ආදායම රුපියල් කෝටි 171·69 ක් විය. මෙය 1961–62 තත්‍ය ආදායමට වඩා රුපියල් කෝටි 9·16 කින් වැඩිය.

අලුත් බදු මාර්ගයෙන් බලාපොරොත්තු වූ රුපියල් කෝටි 9·45 න් රුපියල් කෝටි 7·73ක්ම බලාපොරොත්තු වූයේ වැඩිකළ ආනයන බදු වලිනි. පැවැති බදු ප්‍රමාණයන් පොදු වශයෙන් සියයට 20 කින් වැඩි කිරීමට අමතරව, සිමෙන්ති, සමහර වර්ගවල රෙදිපිළි, බූමිතෙල්, ගුවන් විදුලි යන්ත්‍රවල අමතර කොටස්, බිත්තර, පළතුරු යුෂ, යකඩ සහ වානේ භාණ්ඩ, පුවත්පත් කඩදසි හැර ලියන සහ මුද්‍රණ කඩදසි බීර සහ සුඛෝපභෝගී ආහාර වර්ග ඇතුළු භාණ්ඩ බොහෝ වක් සඳහා ආනයන බදු අය–වැය ලේඛනයෙන් වැඩි කරන ලදී.

අනෙකුත් විධිවිධාන වලින් ආදායම් බදු අධිභාරය සියයට 15 සිට 20 තෙක් වැඩි කිරීමෙන් රුපියල් කෝටියක් ද, මෙතෙක් බදු අය නොකළ දේශීය භාණ්ඩ සඳහා පැන වූ බදු වලින් රුපියල් කෝටි 0·56 ක් ද, මෝටර් රථ පනත යටතේ බලපත්‍ර ගාස්තුව වැඩි කිරීමෙන් රුපියල් දශ ලක්ෂයක් ද, ලබා ගැනීමට ඇස්තමේන්තු කරන ලදී.

### අවක්‍ර බදු ක්‍රමය සංශෝධනය

1963 අප්‍රේල් 1 වැනි දයින් ඇරඹෙන මීලඟ ආදායම් බදු තක්සේරු වර්ෂයේ දී ක්‍රියාත්මක වන පරිදි, අවක්‍ර බදු ක්‍රමය සංශෝධනය කිරීමේ ක්‍රමයක් මුදල් ඇමති වරයා විසින් සිය අයවැය කතාවත් සමග ප්‍රකාශයට පත් කැරිණි. අලුත් ක්‍රමය යටතේ පැනවෙනුයේ බදු වර්ග සතරක් පමණි. එනම්, ආදායම් බද්ද, වස්තු බද්ද, ත්‍යාග බද්ද හා බූදල් බද්දය. වියදම් බද්ද, ඉඩම් බද්ද, ජාතික සංවර්ධන බද්ද, වෘත්තීන් හා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ බද්ද, සහල් ආධාර බද්ද, ආදායම් බද්ද කෙරෙහි ඇති අධි බද්ද හා අධි භාරය යන බදු අවලංගු කැරේ. දැනට පවත්නා ක්‍රමය අනුව ආදායම් බද්ද වැඩි වනුයේ සියයට 5 සිට සියයට 60 දක්වා පමණෙකි. එහෙත් යෝජිත ක්‍රමය යටතේ ආදායම් බද්ද සියයට 15 න් පටන් ගෙන සියයට 80 දක්වා වේගයෙන් වැඩිවේ. තවද, බිරිය සහ දරුවන් වෙනුවෙන් වෙන් කැරෙන බදු මුක්ත දීමනාව, අඩු කැරෙන අතර බදු ශ්‍රේණීන්ද කුඩා වෙයි. යෝජිත ක්‍රමයෙන් බදු පාලනය සැලකිය යුතු ප්‍රමාණයකින් පහසු වනු ඇතැයි අපේක්ෂා කැරෙන අතර අවක්‍ර බදු වලින් ලැබෙන මුළු ආදායම කෙරෙහි මෙය බල නොපානා බවද සැලකේ.

සමාගම් සම්බන්ධයෙන්, දැනට අය කැරෙන ආපසු ගෙවෙන සියයට 33, 1/3 බද්දට අමතරව ආපසු නො ගෙවන සියයට 57 බද්දක්ද පනවා ඇත. මෙය පැනවෙනුයේ, දැනට, පවත්නා ආපසු නොගෙවන සියයට 45 ආදායම් බද්ද, ආදායම් බදු අධි භාරය, ඉඩම් බද්ද හා සමාගම් බද්ද වෙනුවටය. බහි වාසිකයන් සතු සමාගම් දැනට ගෙවන සියයට 6 ක අමතර බද්ද ගෙවිය යුතුය.

එළදයී ආයෝජන දිරි ගැන්වීමේ අටියෙන් ආරක්ෂා කොන්දේසි කීපයකට යටත්ව, රජය අනුමත කළ නව කර්මාන්තවල හා රාජ්‍ය ණයවල කැරෙන ආයෝජන වෙනුවෙන් සහන දීමට අදහස් කොට ඇත. මෙසේ බදු සහන ලැබිය හැකි උපරිම ප්‍රමාණය රු. 25,000 කි. එසේම මෙසේ සහනය ලබන ආයෝජනය, ආයෝජකයාගේ තක්සේරු කළ ආදයමෙන් 1/5 ට වැඩි නොවිය යුතුය. වැවිලි කර්මාන්ත සඳහාද එක්තරා ප්‍රමාණයක සහනයක් සලසනු වස් ඒවා "අනුමත කළ සංවර්ධන ක්‍රම" හැටියට සලකා සියයට 40 ක අතිරේක සංවර්ධන ආධාර මුදලක් දෙනු ලැබේ. මේ අනුව යන්ත්‍රෝපකරණ සහ කම්කරු නිවාස හා සුබ සාධන කාර්යයන් සඳහා වූ ගොඩනැගිලි වෙනුවෙන් පහත දැක්වෙන අයුරු දීමනාවක් එක්වීටම ලැබේ.

යන්ත්‍රෝපකරණ $106\frac{2}{3}$%
කම්කරු හා සුබසාධක ගොඩනැගිලි $73\frac{1}{3}$%

### වර්තන වියදම්

ආවර්තන වැය ශීර්ෂ (1,2,4 සහ 6) මුළු එකතුව, රුපියල් කෝටි 170·69 ක් විය. ප්‍රාග්ධන ස්වරූපීය වැය ශීර්ෂ සහ නිදන් අරමුදල් දීමනා මෙයින් අඩුකළ විට, ලැබෙන වර්තන වියදම් ප්‍රමාණය රුපියල් කෝටි 158·54 ක් වෙයි. මෙය 1961/62 ඇතිවූ තත්‍ය වියදමට වඩා රුපියල් කෝටි 9 කින් වැඩිය. මේ වැඩිවීම ප්‍රධාන වශයෙන්ම ඇතිවූයේ රාජ්‍ය ණය පොළිය විශ්‍රාම වැටුප්, සෞඛ්‍යය, අධ්‍යාපනය, රාජ්‍ය ආරක්ෂාව සහ ආර්ථික සංවර්ධනය සඳහා කැරුන වියදම් වැඩිවීම නිසාය.

### ප්‍රාග්ධන වියදම්

මුල් ඇස්තමේන්තුවට අනුව ප්‍රාග්ධන වියදම, (වැය ශීර්ෂ 3,5 සහ 7 එකතුව) රුපියල් කෝටි 47·33 ක් විය. වර්තන වියදම් යටතේ ඇති ප්‍රාග්ධන වියදම් ශීර්ෂ සහ අය–වැය ලේඛනයට අමත රව සංචිතයෙන් කැරෙන ප්‍රාග්ධන වියදම්, සමග මුළු ප්‍රාග්ධන වියදම රුපියල් කෝටි 57·03 ක් විය. මේ වියදම් සංඛ්‍යා 1961/62 ඇස්තමේන්තු කළ තත්‍ය වියදම් සංඛ්‍යා වලට වඩා රුපියල් කෝටි 2·57 කින් අඩුය. මෙයට ප්‍රධාන හේතුව වූයේ, ලංකා ගමනා ගමන මණ්ඩලය හා වරාය සංයුක්ත මණ්ඩලය වැනි රාජ්‍ය නියෝජ්‍යත්වයනට, අයවැය ලේඛනයෙන් ණය වශයෙන් වෙන් කැරුන මුදල් ප්‍රමාණය අඩුවීමය.

විදේශාධාර මගින් ලැබෙතැයි බලාපොරොත්තු වූ රුපියල් කෝටි 15 න් රුපියල් කෝටි 12·25 ක් සවිස්තරව බෙද වෙන් කොට තිබිණ. මෙයින් වැඩිම මුදල වන, ජාත්‍යන්තර, ප්‍රතිසංස් කරණ හා සංවර්ධන බැංකුවෙන් ලැබෙන රුපියල් කෝටි 4·05 ජල විදුලි ක්‍රමය සඳහා වෙන් කැරිණි, ප්‍රධාන වශයෙන් වෙන් කැරුන අනෙක් ආධාර වලට, එ.ස.සෝ.ස., චීනය, එ.ජ., කැනඩාව, බ්‍රිතාන්‍යය සහ බටහිර ජර්මනියෙන් ලැබෙන ආධාර ඇතුළත් විය. මෙසේ වෙන් කැරුන මුළු මුදලින්, රුපියල් කෝටි 9·33 ක් ණය වශයෙන් ලැබෙන අතර, රුපියල් කෝටි 2·92 ක් දීමනා වශයෙන් ලැබේ.

එක්සත් ජනපදයේ විදේශාධාර පනත යටතේ ලංකාවට දෙන ආධාර අත්හිටවන බව, 1963 පෙබරවාරි 8 වැනි දින එක්සත් ජනපද රජය ප්‍රකාශ කළේය. මෙහි ප්‍රතිඵලය වනුයේ කටුනායක ගුවන් තොටුපල සංවර්ධනයට යෙදවෙන සංවර්ධන ණය අරමුදලෙන් ලැබෙන ඩොලර් ණය නොලැබීයාමයි. මේ ණයෙන් 1962/63 වියදම් කිරීමට ඇස්තමේන්තු කොට ඇති ප්‍රමාණය රුපියල් කෝටි 0·38 ක් වෙයි. 1962/63 අය–වැය ලේඛනයට වෙන්කර ඇති ප්‍රතිපාර්ශවීය අර මුදලෙන් ලැබෙන රුපියල් කෝටි ·90 කෙරෙහි ආධාර අත්හිටවීම බලපාන්නේ නැත.

රාජ්‍ය නීති 480 යටතේ සහ "කෙයාර්" සංවිධානය යටතේ සැපයෙන කිරි හා පිටි විදේශීය ආධාර පනත යටතට නොගැනේ.

දේශීය වෙළෙඳ පොළෙන් ණයට ගැනීමට ඇස්තමේන්තු කළ රුපියල් කෝටි 18·0 බැංකු නොවන දේශීය වෙළෙඳ පොළින් 1960/61 දී ගත්, රුපියල් කෝටි 19·73 හා 1961/62 දී ගත් රුපියල් කෝටි 14·73 හා සැසැඳෙන්නේය. 1962/63 මුල් මාස පහ තුළ දේශීය වෙළෙඳ පොළින් රුපියල් කෝටි 13·87 ක් ණය වශයෙන් ලැබිණි. මෙයින් රුපියල් 9·05 ක් ලැබුණේ බැංකු නොවන මාර්ග වලිනි.